# ජාතික සමූපකාර සංවර්ධන ආයතනය-2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පාවිච්චියෙන් ඉවත් කර තිබුණු රු. 37,679,234 ක් වූ පරිගණක, ලී බඩු, කාර්යාල උපකරණ, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, පුස්තකාල පොත් යනාදී ස්ථාවර වත්කම් ගිණුම්වලින් ඉවත් කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

#### 1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 01 සිට වර්ෂ 05 ක් අතර කාලයක සිට හිඟහිටව තිබුණු පාඨමාලා ගාස්තු හා බාහිර සේවා ගාස්තු එකතුව වූ රු. 1,153,412 ක් 2013 අගෝස්තු 30 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 කට වැඩි කාලයක සිට රු. 14,999,156 ක් වූ ලැබිය යුතු එකතු කළ අගය මත බදු (VAT) සමුච්චිත වී තිබුණත්, එම ශේෂ අයකර ගෙන නොතිබුණි.

### 1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (අ) XIX පරිච්ඡේදයේ 5.3 වගන්තිය | උපලේඛණගත රජයේ නිවාසයක පදිංචි වීම වෙනුවෙන් සේවකයන්ගේ වැටුපෙන් සියයට 10 ක් හෝ ආර්ථික කුලියක් අයකරනු වෙනුවට සේවකයන් 09 දෙනෙකු පදිංචි උපලේඛණ ගත නිල නිවාස වලින් රු.750 සිට රු. 2,000 දක්වා වූ සුළු නාමික කුලියක් අය කර තිබුණි. |
| (ආ) VII පරිච්ඡේදයේ 12 වගන්තිය හා 1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 2012 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 3 කට වැඩි කාලයක් අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් කථිකාචාර්යවරයෙකුට චක්‍රලේඛයට පටහැනිව එකතුව රු. 366,013 ක් වූ වැඩ බැලීමේ දීමනා ගෙවා තිබුණි. |

### 1.2.4 විධිමත් අධිකාර බලය නොලත් ගනුදෙනු

ආයතනයේ කථිකාචාර්යවරුන්ගෙන් ප්‍රමාණවත් හා කාර්යක්ෂම සේවයක් ලබා ගැනීමේ අරමුණ ඇතිව අවම වශයෙන් මසකට දේශන පැය 60 බැගින් වර්ෂයකට දේශන පැය 720 ක් ආවරණය වන පරිදි ආයතනයේ සේවයේ නියුතු කථිකාචාර්යවරු 06 දෙනාට වර්ෂයකට දේශන පැය 4,320 ක කාලසටහන් පිළියෙල කළ යුතුව තිබුණි. ආයතනය මගින් සංවිධානය කර පවත්වනු ලබන පාඨමාලා සඳහා සතියේ දිනවල දේශන පැවැත්වීම වෙනුවෙන් දේශන ගාස්තු නොගෙවිය යුතු බවත්, අවම දේශන පැය සංඛ්‍යාව ආවරණය නොකරන කථිකාචාර්යවරුන් හට බාහිර ආයතනවල ඉල්ලීම මත පවත්වනු ලබන පාඨමාලා සඳහා දේශන පැවැත්වීම වෙනුවෙන්ද දේශන ගාස්තු නොගෙවිය යුතු බවත් ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් 2009 ජූනි 19 දින පවත්වන ලද 59 වැනි

කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. ඊට පටහැනිව ආයතනය කටයුතු කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කථිකාචාර්යවරුන්ගේ අවම දේශන පැය සංඛ්‍යාව ආවරණය වන පරිදි පාඨමාලාවල කාල සටහන් පිළියෙල කර නොතිබුණු අතර කථිකාචාර්යවරුන් විසින් 2012 වර්ෂයේදී පවත්වා තිබුණු තථ්‍ය දේශන පැය 2,274 ක් විය. එය අවම දේශන පැය සංඛ්‍යාවෙන් සියයට 53 ක් වී තිබුණි.

(ආ) කළමනාකරණ මණ්ඩලය තීරණය කළ අවම දේශන පැය සංඛ්‍යාව ආවරණය කර නොතිබියදී, ආයතනය විසින් සංවිධානය කර පවත්වා තිබුණු පාඨමාලා සඳහා සතියේ දිනවල පැවැත්වූ දේශන පැය 335 ක් වෙනුවෙන් දේශන ගාස්තු වශයෙන් රු.260,750 ක් හා බාහිර ආයතනවල ඉල්ලීම මත පවත්වා තිබුණු පාඨමාලා සඳහා දේශන පැය 314 ක් වෙනුවෙන් දේශන ගාස්තු රු.171,500 ක් අවිධිමත් පරිදි කථිකාචාර්යවරුන් දෙදෙනෙකුට ගෙවා තිබුණි.

(ඇ) ආයතනය විසින් සංවිධානය කර පවත්වනු ලබන පාඨමාලාවන් සඳහා ආයතනයේ සේවයේ නියුක්ත ස්ථිර කථිකාචාර්යවරුන්ගේ ආවරණය කළ යුතු පැය 4,320 කින් පැය 2,274 ක් පමණක් දේශන පවත්වා තිබියදී, ප්‍රමාණවත් හා කාර්යක්ෂම සේවයක් ඔවුන්ගෙන් ලබා ගැනීම වෙනුවට බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගෙන දේශන ගාස්තු වශයෙන් රු. 4,178,063 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 6,086,352 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.185,848 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ සමස්ථ පිරිහීම රු. 5,900,504 ක විය.

## 2.2 වියදම්වල වැඩිවීම හා අඛණ්ඩ ඌනතාවය

2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ පස් අවුරුදු කාලය තුළ ආයතනයේ වියදම් වැඩිවීම හා ඊට සාපේක්ෂව ආදායම අඩුවීමත් නිසා අඛණ්ඩව පැවති ඌනතාවය පිළිබඳව විස්තර පහත දැක්වේ.

| | 2012 | 2011 | 2010 | 2009 | 2008 | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| විස්තීරණ ආදායම් හා වියදම් ප්‍රකාශනය අනුව අතිරික්තය/ (ඌනතාවය) | (6.09) | (0.19) | (7.30) | (6.17) | (4.14) | (23.89) |
| ක්ෂය වීම් | 10.03 | 11.19 | 10.30 | 9.36 | 8.63 | 49.51 |
| ක්ෂය ගැලපීමට පෙර අතිරික්තය | 3.94 | 11.00 | 3.00 | 3.19 | 4.49 | 25.62 |
| අඩු කළා : | | | | | | |
| පුනරාවර්තන ප්‍රදාන හා ප්‍රාග්ධන ප්‍රදාන හිලව් කිරීම හා ප්‍රත්‍යාගණන ලාභ | 44.73 | 32.47 | 22.39 | 21.47 | 19.68 | 140.74 |
| ඌනතාවය | (40.79) | (21.47) | (19.39) | (18.28) | (15.19) | (115.12) |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 සිට 2012 දක්වා වූ වර්ෂ 05 තුළ ආයතනයෙහි වියදම් එකතුව රු. මිලියන 253.82 ක් වූ අතර වෙනත් ආදායම්වල එකතුව රු.මිලියන 138.70 ක් විය. මේ අනුව, ආදායමට වඩා වියදමෙහි වැඩිවීම රු. මිලියන 115.12 ක් වුවත් ආයතනයෙහි වියදම වැඩිවීමට සාපේක්ෂව ආදායමේ වැඩිවීමක් සිදුවී නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2001 අංක 1 දරන ජාතික සමූපකාර සංවර්ධන ආයතනය (සංස්ථාපනය කිරීමේ) පනතේ 4 වගන්තිය පරිදි ආයතනය සංස්ථාගත කිරීමෙන් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත වූ පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටු කර නොතිබුණි.

(i) සමූපකාර සංවර්ධනය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.

(ii) සමූපකාර සංවර්ධනයට අදාල දත්ත රැස්කිරීම අරහයා සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාකිරීම හා රැස්කරන ලද දත්ත ප්‍රකාශනය කිරීම මගින් සංචයනය කිරීම හා පතල කිරීම

(iii) කළමනාකරණ නිපුනතා අවශ්‍යවන සමූපකාර ව්‍යවසායන් භාරගෙන කළමනාකරණය කිරීම.

(iv) සමූපකාර ව්‍යවසායවලට වෘත්තීය උපදෙස් සැපයීම.

(ආ) ආයතනය විසින් පවත්වන ලද පාඨමාලාවල ප්‍රගතිය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| පාඨමාලාව/වැඩසටහන | 2012 ඉලක්කගත | | 2012 තථ්‍ය | | 2011 තථ්‍ය | |
|---|---|---|---|---|---|---|
| | පාඨමාලා/ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව | පාඨමාලා/ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව | පාඨමාලා/ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව |
| සමූපකාර නිත්‍ය පුහුණු පාඨමාලා | 02 | 72 | 02 | 92 | 03 | 110 |
| උසස් ඩිප්ලෝමා පාඨමාලා | 15 | 309 | 14 | 279 | 16 | 297 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සහතික පත්‍ර පාඨමාලා | 07 | 155 | 06 | 173 | 05 | 81 |
| කෙටිකාලීන කළමණාකරණ සංවර්ධන පුහුණු වැඩසටහන් | 24 | 600 | 18 | 491 | 12 | 351 |
| බාහිර ආයතනවල ඉල්ලුම මත පවත්වන ලද පුහුණු වැඩසටහන් | - | - | 19 | 850 | 16 | 682 |
| සමූපකාර ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා නොමිලයේ පවත්වන ලද පුහුණු වැඩසටහන් | - | - | 23 | 764 | 08 | 380 |
| බාහිර උපාධි හා වෘත්තීය ගිණුම්කරණ විභාග සඳහා උපකාරක වැඩ සටහන් | - | - | 10 | 213 | 04 | 57 |
| එකතුව | 48 | 1,136 | 92 | 2,862 | 64 | 1,958 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත කෙටිකාලීන කළමනාකරණ සංවර්ධන පුහුණු වැඩසටහන් 24 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණද, පවත්වා තිබුණේ වැඩසටහන් 18 ක් පමණකි. ඒ අනුව කාර්ය සාධනය සියයට 75 ක් විය.

(ii) බාහිර ආයතනවල ඉල්ලුම මත හා සමූපකාර ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා නොමිලයේ පවත්වන පුහුණු වැඩසටහන් සහ බාහිර උපාධි හා වෘත්තීය ගිණුම්කරණ විභාග සඳහා උපකාරක වැඩසටහන් සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබුණද, ඒවායේ ඉලක්ක තීරණය කර නොතිබුණි.

3.2 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රවණාගාරය ඉදිකිරීම් කටයුතුවල පැවති වර්ෂ 4 ක ප්‍රමාදය හේතුවෙන් 2010 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.20,056,450 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රයෝජනයට නොගෙන බැංකු ජංගම ගිණුමේ වර්ෂ 02 ක පමණ කාලයක් නිශ්ක්‍රීයව තබා තිබුණි.

(ආ) සමූපකාර ක්ෂේත්‍රයේ 2010 වර්ෂයේ ජාතික ඵලදායිතා කාර්යසාධන තරඟ වැඩසටහන් සඳහා රාජ්‍ය බැංකුවකින් 2011 මැයි 31 දින ලැබුණු රු.2,932,250 ක් වූ ප්‍රදානයකින්, රු.1,342,856 ක් උපයෝජනය නොකර 2012 දෙසැම්බර් 31 දින වනවිටත් බැංකු ජංගම ගිණුමේ තැන්පත් කර තිබුණි.

(ඇ) වර්ෂ 05 ක කාලයක් තිස්සේ බැංකු ජංගම ගිණුම්වල සමුච්චිත වී තිබුණු රු.893,843 ක් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන තක්සේරුකරු අනුව, බහු කාර්ය ගොඩනැගිල්ලේ බිම් මහලේ වාර්ෂික කුලී තක්සේරුව රු.390,000 ක් වුවත්, එය රු.195,000 ක වාර්ෂික කුලියක් මත 2010 අප්‍රේල් 01 දින සිට 2015 මාර්තු 31 දින දක්වා වර්ෂ 05 කට සමූපකාර සමිති සංගමයකට තක්සේරු මුදල නොසලකා අවිධිමත් ලෙස බදු දී තිබුණි. මේ හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු. 536,250 ක කුලී ආදායමක් ආයතනයට අහිමි වී තිබුණි.

(ආ) ආයතනයේ බස් රථය පෞද්ගලික පාර්ශ්වයන්ටද කුලියට ලබාදී තිබුණු අතර ඒ සඳහා කිලෝමීටර් 100 ක් වෙනුවෙන් දිනකට රු. 8,000 ක මූලික ගාස්තුවක් හා අමතර කිලෝමීටර් 01 ක් වෙනුවෙන් රු.65 ක් බැගින් ගාස්තුවක් අය කර ගත යුතුව තිබුණි. නමුත් රේඛීය අමාත්‍යාංශ නිලධාරීන්ගේ පෞද්ගලික ගමන් සඳහා ගාස්තු අය නොකර, බස් රථය කිලෝමීටර් 12,505 ක් ධාවනය කිරීම සඳහා ඉන්ධන වෙනුවෙන් රු. 277,626 ක් වැය කර තිබුණි. තවද, ඒ වෙනුවෙන් අයවිය යුතු රු. 841,780 ක් ආයතනයට අහිමි වී තිබුණි.

3.4 අනාර්ථික ගනුදෙනු

තොරතුරු තාක්ෂණ විෂයයට අදාල පාඨමාලා ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාවෙන් බැහැරව කොන්ත්‍රාත් පදනම මත උපදේශකවරයකු බඳවාගෙන 2012 වර්ෂයේදී

උපදේශක දීමනා වශයෙන් රු. 360,000 ක් ගෙවීම් කර තිබුණි. කෙසේ නමුත් ඔහුගේ උපදේශකත්වයෙන් නව පාඨමාලා ආරම්භ කිරීමට හෝ පාඨමාලා සඳහා පුහුණුලාභීන්ගේ සහභාගීත්වය වර්ධනය කරලීමට හෝ පාඨමාලාවල තත්ත්වය නැංවීමට හෝ ආදායම වර්ධනය කිරීමට හෝ කටයුතු සිදුකර නොතිබුණු අතර උපදේශක සේවා ලබා ගැනීම තුළින් මෙම පාඨමාලාවන්හි අපේක්ෂිත ප්‍රවර්ධනයක් සිදුව නොතිබුණි

## 3.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

මුද්‍රණ අංශයට අයත් මුද්‍රණ යන්ත්‍ර 03 ක් පාවිච්චියට නොගෙන වර්ෂ 10 කට වැඩි කාලයක් නිශ්ක්‍රීයව තිබුණි.

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) ශ්‍රවණාගාරය ඉදිකිරීම

ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා රු. මිලියන 44.5 ක පිරිවැය ඇස්තමේන්තුවකට පෞද්ගලික ඉදිකිරීම් සමාගමකට 2001 අගෝස්තු මාසයේදී පවරා තිබුණි. ඉදිකිරීම් කටයුතු 2003 අප්‍රේල් මාසය වන විට අවසන් කළ යුතුව තිබුණද, වහලය ඉදි කිරීම් කටයුතු සිදු කෙරෙමින් පැවතියදී 2005 පෙබරවාරි 14 දින වහලය කඩා වැටීම නිසා ඉදි කිරීම් අතරමඟ නතර වී තිබුණි. කෙසේ වෙතත්, වහලයේ සම්පූර්ණ ඉදිකිරීම්ද ඇතුළත්ව ඉතිරි වැඩ නිම කිරීම සඳහා රු.මිලියන 113 ක් වූ නව පිරිවැය ඇස්තමේන්තුවකට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට 2009 වර්ෂයේදී පවරා, 2010 දෙසැම්බර් 31 දින අවසන් කළ යුතු වුවත්, 2013 ජුලි 30 දින වන විටත් ඉදිකිරීම් නිම වී නොතිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයෙන් ලබා දී තිබූ ආරවුල් නිරාකරණය කිරීමේ වාර්තාව හා 2012 මැයි 31 දිනැති අංක සීඅයිටී/4/4/8/2 දරන රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිපිය අනුව වහලය කඩා වැටීම නිසා ආයතනයට සිදුව තිබූ රු.3,907,904 ක් වූ අලාභය, ඉදිකිරීම් සඳහා උපදේශක සේවා සැපයූ උපදේශකවරියගෙන් හා ඉදිකිරීම් සමාගමෙන් සියයට 50 බැගින් අයකර ගැනීම

සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට නියෝග කර තිබුණද, 2013 ජූනි 30 දින වන විටත් එම අලාභ අය කර ගෙන නොතිබුණි.

(ii) උපදේශක සේවා සැපයූ උපදේශකවරිය රාජ්‍ය සේවයේ නියුක්තව සිටියදී අනවසරයෙන් පෞද්ගලික උපදේශක සේවා සපයා, රු.මිලියන 2.15 ක් වූ ගාස්තු ලබා ගැනීම සම්බන්ධයෙන් ඇයට එරෙහිව විනයානුකූලව කටයුතු කර නොතිබුණි.

(iii) ඉදිකිරීම් ආරම්භ කළ 2001 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂ 11 ක දීර්ඝ කාල ප්‍රමාදය හා විටින් විට ඉදිකිරීම් සැලසුම් සංශෝධනය වීම හේතුවෙන් රු.මිලියන 44.5 ක පිරිවැයකට නිම කළ හැකිව තිබුණු ඉදිකිරීම්, මුළු පිරිවැය රු.මිලියන 255.0 ක් දක්වා එනම්, රු. මිලියන 210.5 කින් වැඩි වී තිබුණි.

(ආ) සේවා පහසුකම් ප්‍රසම්පාදනය

2012 වර්ෂයේදී ආරක්ෂක, පවිත්‍රතා, භෝජනාගාර යනාදී සේවා සැපයීම් ප්‍රසම්පාදන පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආරක්ෂක, පවිත්‍රතා, භෝජනාගාර යනාදී සේවා සැපයීම් කොන්ත්‍රාත්තු සඳහා ලංසු කැඳවීමෙන් තොරව, 2011 වර්ෂයේදී අවිධිමත් පරිදි ලබාගත් මිල ගණන් මත කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණු පෞද්ගලික සමාගමටම ඉහත කොන්ත්‍රාත්තු 03 හි ගිවිසුම්ගත කාලය 2012 වර්ෂය දක්වා දීර්ඝ කර කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි.

(ii) කොන්ත්‍රාත්තු ගිවිසුම් අනුව පවිත්‍රතා සේවා සැපයීම සඳහා රු. 224,930 ක් වූ මාසික ගාස්තුව 2012 අප්‍රේල් මස සිට රු. 284,212 ක් දක්වා රු. 59,282 කින් අවිධිමත් ලෙස වැඩිකිරීම හේතුවෙන් ආයතනයට 2012 වර්ෂයේදී රු. 533,538 ක පාඩුවක් සිදුව තිබුණි.

3.7 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 71 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 22 ක් වූයෙන්, පුරප්පාඩු සංඛ්‍යාව 49 ක් විය. මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මු.රෙ.71 ප්‍රකාර අනුමැතිය ලබා දී තිබුණද, 2012 දෙසැම්බර් 31 වන තෙක් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

4.1 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාර 2012 – 2016 වර්ෂ සඳහා වූ සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි.

4.3 ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර ආයතනයේ සභාපතිවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) හිඟහිටි ආදායම්

(ඇ) කොන්ත්‍රාත්තු පරිපාලනය

(ඈ) මානව සම්පත් කළමනාකරණය.